# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 03

## ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කර සරල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි - බහුවරණ සහ කෙටි ප්‍රශ්න

1. පහත තොරතුරු 2022 මාර්තු මාසය සඳහා ව්‍යාපාරයකට අදාළ වේ.

| විකුණුම් | ලකුණු කළ මිල (රු'000) | වෙළඳ වට්ටම් |
|---|---|---|
| මුදලට | 2,000 | 10% |
| ණයට | 4,000 | 5% |

විකුණු දින සිට දින 15 ක් ඇතුලත මුදල් පියවීමේදී ණයගැතියන්ට 5 % ක මුදල් වට්ටමක් දෙනු ලැබේ. ව්‍යාපාරයේ වාර්තාවලට අනුව ණයගැති ශේෂ වලින් 50% ක් මෙම වට්ටම භාවිතා කරමින් පියවා ඇත.

ණයගැතියන්ට දුන් වට්ටම් සටහන් කිරීම සඳහා නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

| | හර (රු.) | | බැර (රු.) | |
|---|---|---|---|---|
| (1) | දුන් වට්ටම් ගිණුම | 95,000 | මුදල් ගිණුම | 95,000 |
| (2) | දුන් වට්ටම් ගිණුම | 95,000 | ණයගැති පාලන ගිණුම | 95,000 |
| (3) | දුන් වට්ටම් ගිණුම | 195,000 | මුදල් ගිණුම | 195,000 |
| (4) | දුන් වට්ටම් ගිණුම | 295,000 | ණයගැති පාලන ගිණුම | 295,000 |
| (5) | දුන් වට්ටම් ගිණුම | 395,000 | මුදල් ගිණුම | 395,000 |

2. සමගිගේ ව්‍යාපාරයේ 2022.03.31 දිනෙන් අවසන් වර්ෂයේ රු.250,000 ක යන්ත්‍රය අළුත් වැඩියා වියදමක් යන්ත්‍ර ගිණුමට පිටපත් වී ඇත.ව්‍යාපාරය යන්ත්‍ර වාර්ෂිකව 10 % බැගින් ක්ෂය කරනු ලබයි.

ඉහත වරද නිවැරදි කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1)
| | | හර | |
|---|---|---|---|
| යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම | හර | 250,000 | |
| යන්ත්‍ර ගිණුම | | | 250,000 |

(2)
| | | හර | |
|---|---|---|---|
| යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම | හර | 250,000 | |
| යන්ත්‍ර ක්ෂය ගිණුම | හර | 25,000 | |
| යන්ත්‍ර ගිණුම | | | 250,000 |
| යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම | | | 25,000 |

| | | | | |
|---|---|---|---|---|
| (3) | යන්ත්‍ර ගිණුම | හර | 250,000 | |
| | යන්ත්‍ර ක්ෂය ගිණුම | හර | 25,000 | |
| | යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම | | | 250,000 |
| | යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම | | | 25,000 |
| (4) | යන්ත්‍ර ගිණුම | හර | 250,000 | |
| | යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම | | | 250,000 |
| (5) | යන්ත්‍ර අළුත්වැඩියා ගිණුම හර | හර | 250,000 | |
| | යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම හර | | 25,000 | |
| | යන්ත්‍ර ගිණුම | | | 250,000 |
| | යන්ත්‍ර ක්ෂය ගිණුම | | | 25,000 |

3. අෂනායාගේ ව්‍යාපාරයේ 2022.03.31 දිනට විකුණුම් ජනලයේ මුළු වටිනාකම් තීරුවේ එකතුව රු. 172,500 කි. වැට් බදු අනුපාතය 15 % කි. ඉහත තොරතුරු පොදු ලෙජරයට වාර්තා කිරීමට අදාල ජනල් සටහන ලියන්න.

4. මනුරංගගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට දී ඇත.

| | |
|---|---|
| 2022.12.31 දිනට වැටුප් හා වේතන (ශුද්ධ) | 21,600 |
| සේවක අර්ථසාධක අරමුදලට ගෙවීම. (සේව්‍යයා) | 3,600 |
| සේවක භාරකාර අරමුදලට ගෙවීම | 720 |

සේවකයන්ට වැටුප් ගෙවීමේදී වැටුපෙන් 10 % ක් සේවක අර්ථසාධක අරමුදලට අඩු කර ගෙන වැටුප් ගෙවනු ලබන අතර, වැටුපෙන් වෙනත් අයකර ගැනීම් නොමැත. සේව්‍යයා විසින් සේවක අර්ථසාධක අරමුදලට 15% ක්ද සේවක භාරකාර අරමුදලට 3 % ක් ද දායක වේ.

2022.03.31 දිනට වැටුප් හා වේතන ගිණුම් ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න.

5. ණයගැතියෙකු විසින් රු. 60,000 ක් පියවීම සඳහා රු. 54,000 ක චෙක්පතක් ලබා දී ඇති අතර එය බැංකු ගත කල පසු අගරු කළ බව බැංකුව විසින් දැනුම් දෙන ලදි. චෙක්පත අගරු වීම සම්බන්ධව නිවැරදි ද්විත්ව සටහන ලියා දක්වන්න.

6. සුදු නෙළුම් කාන්තා සමිතියේ 2021.04.01 දිනට සාමාජිකයින් 150 දෙනෙකු විය. මේ අතරින් 8 දෙනෙකු 2019.04.01 දින රු. 30,000 බැගින් ගෙවා යාවජීව සාමාජිකත්වය ලබා ගෙන ඇත. සමිතියේ ප්‍රතිපත්තිය වනුයේ යාවජීව සාමාජික අරමුදල වසර 10 ක් තුළ වාර්ෂික ආදායම ලෙස හඳුනා ගැනීමයි. වාර්ෂිකව යාවජීව සාමාජික මුදල් ගිණුම් ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න.

7. පහත දැක්වෙනුයේ මහීපාල සමාගමේ 2021.04.01 දිනට ශේෂයන්ය.

| | (රු.) |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (කොටස් 150,000) | 1,500,000 |
| ප්‍රත්‍යාගණන සංචිත | 250,000 |
| රඳවාගත් ඉපැයුම් | 700,000 |

සමාගමේ දැනට සිටින කොටස් හිමියන්ට ප්‍රසාද කොටස් නිකුතුවක් කිරීම සඳහා සංචිත යොදා ගැනීමට සමාගම තීරණය කරන ලදි. සෑම කොටස් හිමියෙකුටම 1/5 ක් ලැබෙන ලෙස ප්‍රසාද කොටස් නිකුතුව සිදුවිය. ප්‍රසාද කොටස් නිකුතුවට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

8. වැට් සඳහා ලියාපදිංචි වී ඇති ABC ව්‍යාපාරයේ පහත ගනුදෙනුව සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.
   - Y ගෙන් මිලදී ගැනුම් රු.200,000 (වැට් රහිත) අය කළ වැට් 8%

9. වැට් සඳහා ලියාපදිංචි වූ ව්‍යාපාරයක ආපසු එවුම් ජ'නලයේ ගනුදෙනු පොදු ලෙජරයේ පිටපත් කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ කුමක්ද?

10. විකිණීමේ හා ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩවල වටිනාකම රු. 240,000කි. මෙම භාණ්ඩ වලින් ඉන්වොයිස් අගය රු.60,000ක භාණ්ඩ අවසාන ගිණුම් පිළියෙල කළ 2022.03.31 දිනට ඉතිරිව තිබුණි. භාණ්ඩ මිල කරනුයේ ගත් මිලට 20%ක ලාභ ප්‍රතිශතයක් එකතු කිරීමෙනි.

ඉතිරි තොග ගිණුම්ගත කිරීමට අදාල ද්විත්ව සටහන වන්නේ, (රු'000)

| | | | | |
|---|---|---|---|---|
| (1) | අවසාන තොග ගිණුම | හර | 50 | |
| | වෙළඳ ගිණුම | | | 50 |
| (2) | අවසාන තොග ගිණුම | හර | 60 | |
| | වෙළඳ ගිණුම | | | 60 |
| (3) | විකුණුම් ගිණුම | හර | 50 | |
| | වෙළඳ ගිණුම | | | 50 |
| (4) | විකුණුම් ගිණුම | හර | 60 | |
| | වෙළඳ ගිණුම | | | 60 |
| (5) | අවසාන තොග ගිණුම | හර | 60 | |
| | විකුණුම් පිරිවැය ගිණුම | | | 60 |